**31 වන පිටෙන්**

අරමුණකින් රටට යම් වැඩදායී දෙයක් කරන්නට ඉදිරිපත් වෙන කෙනෙක් ගැන මැදිහත්භාවයකින් යමක් කරන කෙනෙක් ගැන මේ වගේ පහත් තත්වයකට දාලා කතා කිරීම ගැන ජාතියක් හැටියට අපි ලැජ්ජා විය යුතුයි. බහුතරයක් ලාංකිකයින් අද දේශපාලන හා විවිධ පාර්ශවවල වහලුන් වී ඇති අවාසනාවන්ත තත්වයෙන්, 225 දෙනෙකුගෙ සුබවිහරණයට කෝටි දෙකක ජනතාවක් නැටවෙන ඒ වහල් බවින් මුදවන අප සියළුදෙනාගේම එකමුතුවෙන් යා යුතු ගමනකට මුල් අදියර ලෙසින් ආකල්පමය වෙනසක් සිදුකිරීමටයි මා උත්සාහගන්නෙ. අපේ රට ගොඩ දාන්න බෑ කියන ආකල්පයට මුලින්ම තිත තබා, අපේ රට ගොඩ නැගිය හැකියි කියන චින්තනයට දෙස් විදෙස් සියළු ලාංකිකයින් යොමු කරලීමයි එහි අරමුණ.

**ඔබ ඒ අරමුණ කරා යාමට ගන්නේ සර්වාගමික ප්‍රවේශයක් ද?**

කිසිසේත්ම නෑ. කතෝලිකයින්ට කතෝලිකයින් ලෙසත් බෞද්ධයින්ට බෞද්ධයින් ලෙසත් අන් ආගම්වල අයට ඒ ඒ ආගම්වල රැදෙමින්ම සියළුදෙනාටම ශ්‍රී ලාංකිකයින් ලෙස ඒ සියළු ආගම්වල ඉගැන්වෙන යහපත් ආධ්‍යාත්මික ගුණ හරහා බෞද්ධ රටක් ලෙසින් අපේ රට වඩාත් යහපත් තැනකට ගෙනයා හැකි බවයි මගේ විශ්වාසය. ඔබ දන්නවා අපේ රට බෞද්ධ දර්ශණය මත පදනම් වූ විශිෂ්ඨ සංස්කෘතියකින් ගොඩනැගුණු රටක්. කරුණාව මෛත්‍රියෙන් පිරුණු විවෘත මනසකින් යුත් අන්මත ඉවසන නිදහස් මේ බෞද්ධ දර්ශණය තුලින් හැඩගැහුණු සංස්කෘතියට සමාන වූ සංස්කෘතියක් ලොව අන් කිසිම ආගමක් හරහා විශේෂයෙන් ඒක දේවවාදී අගමක් හරහා ඇතිවෙන්නෙ නෑ.. .ඒක අපි හැමෝම කුහකකමින් තොරව පිළිගත යුත්තක්. ඒ නිවැරදි බෞද්ධ දර්ශණය  මුල්කරගත් සංස්කෘතික වටපිටාවක් තුළ පවතින විවෘත භාවය නිදහස් බව තවදුරටත් තහවුරු කරගනිමින් වඩාත් යහපත් හෙට දවසක් වෙනුවෙන් අපේ ආදරණීය රට, උණුසුම් හදවත් ඇති ආදරණීය මිනිසුන් වෙසෙන රට යොමුකරලීම තමයි මගේ අපේක්ෂාව.

**ඔබ අද ගෙන ඇති මේ අසීරු නමුත් අද රටේ පවතින වටපිටාවට අනුව ඉතාම කාලෝචිත මේ ප්‍රවේශය වෙනුවෙන් ඔබ යොමුවීමට බලපෑ කාරණා මොනවාද? ඔබට ලැබුණු පරමාදර්ශයන් ගැන යම් සඳහනක් කරනවානම්...**

මා කුඩා කාලයේ වසර 6ක කාලයක් හැදුනෙ වැඩුනේ ගරු ඔස්කා අබේරත්න පියතුමන් ඇසුරේ. ඔස්කා පියතුමන් බටහිර අභාශයෙන් කිතුනුවන් මුදවාගෙන ලාංකීය සංස්කෘතිය හා හැඩගැහුණු ලාංකික කතෝලිකයින් බවට පත්කරලීමට පුරෝගාමි වූ කෙනෙක්. එතුමන් හැමවිටම ලංකාව බෞද්ධ රටක් වශයෙන් පැවතීමේ වැදගත් කමත් බෞද්ධ දර්ශණය තුලින් බිහි වූ ලාංකීය සංස්කෘතියේ විශිෂ්ඨ බවත් අගය කල කෙනෙක්. කතෝලික පූජා වලදී බටහිර ලෝගුව වෙනුවට අපේ ජාතික ඇඳුම ඇඳීමේ පූර්වාදර්ශය ලබා දුන්නේ එතුමායි. මගේ ජීවිතයේ විශාල වෙනසක් ඇතිකිරීමට හේතුවුණා ගරු ඔස්කා පියතුමන් හා තිබුණ ඇසුර. ඒ වගේම පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන් වගේම මහාචාර්ය කාලෝ ෆොන්සේකා මගේ ජීවිතයට ආලෝකයක් ගෙනදුන් මා ඉතා සමීපව ඇසුරුකළ අය වුණා. තවත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ම මා කිට්ටුවෙන් ඇසුරු කරනවා. ඔවුන් බොහෝ දෙනෙක් දේශපාලන ගැතිභාවයන් වලින් තොරව පටු ආගමික බෙදීම් වලින් තොරව අපේ රට අද පවතින තත්වයෙන් ගොඩ ගැනීමට අවංක උවමානවක් තිබූ සහ තිබෙන අය.

**ඔබ මැයි මස 27 වෙනි දින ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර බර්වුඩ් බිසන් සෙන්ටර් හිදී ඕබේ කඳුළ වැඩසටහන මියුරු සංගීතයත් සමගින් ඉතාමත් විචිත්‍ර ආකාරයෙන් පැවැත්වීමට මේ දිනවල කටයුතු කරගෙන යනවා. මේ වැඩසටහන නැරඹීම සඳහා සහාභාගි වෙන අයගෙන් කිසිදු මුදලක් අයකර නොගෙන නොමිලේම සහභාගිවීමට අවස්ථාව ලබා දෙන බවත් දැනගන්න ලැබුණා. කොහොමද මේ සා විශාල පිරිවැයක් දැරිය යුතු ප්‍රසංගයක් නොමිලේ පවත්වන්නෙ?**



ඇත්තටම මෙය විශාල මුදලක් වැයවෙන කාර්යයක්.. ශාලාව සඳහා, ලංකාවෙන් ගෙන්වනු ලබන 12 දෙනෙකුගෙන් යුත් සංගීත කණ්ඩාමේ වියහියදම් ආදිය සඳහා සැළකිය යුතු මුදලක් වැයවෙනවා. මේ සඳහා මෙල්බර්න් නුවර ජීවත් වෙන සහෝදර ශ්‍රී ලාංකිකයින් කිහිපදෙනෙකුම තමන්ගේ දායකත්වය ලබාදෙන්න ඉදිරිපත් වී සිටිනවා. ඒවගේම අපේ ප්‍රවාහන පහසුකම් ඉඳුම් හිටුම් කෑමබීම ආදිය සම්බන්ධයෙනුත් ඒ පහසුකම් සපයා දෙන්නට දැනටමත් පිරිසක් ඉදිරිපත් වී සිටිනවා. මේ අනුව අපට සැහෙන මුදලක් මේවනවිටත් එකතුවී ඇතත් තවත් හිඟ මුදල් ප්‍රමාණයක් පියවා ගැනීමට අපි මේ දිනවල කටයුතු කරගෙන යනවා. අපි බලාපොරොත්තු වෙනවා මේ වැඩසටහන සාර්ථක කරගැනීමට ඒ හිඟ මුදල් ප්‍රමාණයත් පියවා ගැනීමට මෙල්බර්න්වාසී අපේ හිතවත් ශ්‍රී ලාංකික සහෘදයින්ගේ සහය අපට ලැබේවි කියා. ඒ අනුව මේ වැඩසටහනට සහභාගි වන පිරිසගෙන් කිසිදු මුදලක් අය නොකර ඔවුන්ට යම් රසවින්දනයක් සමගින් ආධ්‍යාත්මික ප්‍රභෝධයක් ඇති කර ගැනීමට ඉඩ සලසා දීමට අපට හැකිවේ යැයි විශ්වාස කරනවා.

**යම් කෙනෙකුට මේ සඳහා යම් දායකත්වයක් දැක්වීමට උවමනා නම් කොහොමද ඒ සඳහා සම්බන්ධ වෙන්නෙ?**

මේ වැඩසටහන සංවිධානය කරන පිරිසෙන් කෙනෙක්ව අමතා ඒ පිළිබඳව තොරතුරු දැනගත හැකියි.
නිරෝෂා - 0433789381
ෆෙලීෂියන් - 0434853163

**ශ්‍රී ලංකාව අතහැරලා ඕස්ට්‍රේලියාව වගේ රටකට ඇවිත් ස්ථිර පදිංචිය ලැබූ අයට මේ කඳුළලවැඩසටහන පැවැත්වීමෙන් ඔබ බලාපොරොත්තුවෙන අරමුණ කරා යෑමට දායකත්වයක් ලැබෙයි කියා ඔබ හිතනවද?**

පැහැදිළිවම ඔව්. මා හොඳින්ම දන්නවා විවිධ හේතු කාරණා නිසා ඔබ අද වෙද්දි මේ රටට ඇවිත් පදිංචි වී සිටියත් ඒ හැඟීම් බර උණුසුම් හදවත් ඇති මිනිසුන් ජීවත් වෙන, ඔබේ කුඩා අවධිය ගත කළ ඒ සොබාදහමේ සියළු සුන්දරත්වය ඇති වූ ඔබ උපන් රට ගැන පුංචි හෝ හැඟීමක් ඔබතුළ තිබෙනවා. ඕස්ට්‍රේලියාවෙ උපන් මෙහි හැදී වැඩෙන ඔබේ දරුවන් තුළත් තමන්ගේ දෙමාපියන් උපන් රට යන හැඟිම නිසාවත් අවම වශයෙන් ලංකාව ගැන හැඟීමක් තිබිය හැකියි. මෙවැනි දියුණු හා විවෘත නිදහස් වටපිටාවක හැදී වැඩෙන ඔබේ දරුවන් බොහෝ සෙයින් විවෘත අදහස් දරන, අවංකව සිතන පතන, සෘජුව කතා කරන, පටු අදහස් වලට යට නොවූ නිදහස් මානසිකත්වයකින් යුතු දරුවන්. ඔවුන් ගෙන් අපේ රටට වියයුතු සේවාවක් තිබෙනවා....අපේ රටේ හැදෙන වැඩෙන දරුවන්ට ඔබේ දරුවන්ගෙන් උගත හැකි දේ බොහෝයි. ඔබෙන් ලද හැකි දේ බොහෝයි. ලංකාවට නිවාඩුවට යනවිට ඔබේ හිතවතුන්ට ටොෆි චොකලට් වෙනුවට ඔබ හා ඔබේ දරුවන් හරහා ඔබ මේ රටේ භුක්ති විඳින නිදහස, විවෘතභාවය, විනය, සමාජ වගකීම ආදී යහපත් දේ ඔවුන්ට රැගෙන යන සංස්කෘතියක් බිහිකර ගත යුතු බවයි මගේ හැඟීම. එය ඔබට මේ මොහොතේ ඔබේ උපන් බිම වෙනුවෙන් කල හැකි යහපත් මෙහෙවරක් වෙනවා......ඒ හරහා යම් පමණකට හෝ අපේ රටේ මිනිසුන්ගෙ ආකල්ප යහපත් අතට හැරවීමේ ක්‍රියාවලියට විදෙස්ගතව සිටින ඔබටත් දායක විය හැකියි. මේ පිළිබඳව ඔබට යම් පණිවිඩයක් ලබාදී ඔබට ඒ වෙනුවෙන් කළ හැකි කාර්‍යභාරය ගැන බුද්ධිමය සංවාදයකට එළඹීමට මට කඳුළ වැඩසටහන හරහා අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා විදෙස් රටවල ජීවත් වෙන ශ්‍රී ලාංකිකයින්ට මේ සම්බන්ධයෙන් වැදගත් මෙහෙවරක් කල හැකි බව.

චාල්ස් සහෝදරතුමා, ඔබ ගන්න මේ උත්සාහය යම් දිනක මල් ඵල ගැන් වී අපේ රටේ මිනිසුන් අතර භේද දුරු වී බුදු දහම හා කතෝලික දහම මුල් කොටගත් සියළු ආධ්‍යාත්මික ගුණයන්ගෙන් පෝෂිත යහපත් ධනාත්මක ආකල්ප සහිත මිනිසුන්ගේ එකතුවෙන් අප උපන් බිම අදට වඩා හැම අතින්ම ඉදිරියට ගිය සුන්දර රටක් බවට පත් වේවායි පතමින් මැයි මස 27 වෙනි දින බර්වුඩ් බිසන් සෙන්ටර් හීදී පැවැත්වීමට නියමිත ඔබේ කඳුළ වැඩසටහන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමින් ඔබට සමු දෙනවා. ආයුබෝවන්.

